## සිංහල පරිවර්තනය

**නිවේදන අංක: R/2026/11**

# උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහකාර (කෘෂි ව්‍යාප්ති) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම්ගේ අංක CP/DEC/26 දරණ 2026.03.11 දිනැති ලිපිය මගින් යොමුකරන ලද 2026.03.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සහ උතුරු පළාතේ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/31/01/Appoint.Gen දරණ 2026.04.25 දිනැති ඉල්ලීම් ලිපියට අනුව උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහකාර (කෘෂි ව්‍යාප්ති) **III** ශ්‍රේණියේ පවතින පවතින පුරප්පාඩු **පනස් දෙකක් (52)** සඳහා බඳවා ගැනීම වෙනුවෙන් පැවැත්වෙන විවෘත තරඟ විභාගය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2026 ජූලි** මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.06.12** වේ.

## **02.** බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1 2014.07.10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය - 3 සේවා ගණයේ (MT-01-2006A) තාක්ෂණික සහකාර (කෘෂි ව්‍යාප්ති) සේවයට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කොන්දේසි වලට සහ එහි කලින් කලට සිදුකරන ලද සංශෝධනවලට අනුව ද, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති සහ සහ මෙම තනතුරට අදාළව කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසි, නීති, නියෝග යනාදියට යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් **තාක්ෂණික සහකාර (කෘෂි ව්‍යාප්ති)** III **ශ්‍රේණියට** පත්කරනු ලැබේ.

02.2 මෙම තරඟ විභාගය මගින් පත්වීමක් සඳහා තෝරාගන්නා අපේක්ෂකයින් තම පත්වීම් දිනයේ සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව **තාක්ෂණික සහකාර (කෘෂි ව්‍යාප්ති)** III **ශ්‍රේණියට** පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි **තාක්ෂණික සහකාර (කෘෂි ව්‍යාප්ති)** III **ශ්‍රේණියට** පත් වූ දින සිට වසර තුනක් (03) ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

02.3 මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් "උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය" යන කොන්දේසියට යටත් විය යුතුය.

02.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත්වූ නිලධාරියෙකු සේවයෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ලබා යුතුය.

02.5 විවෘත තරඟ විභාගය මගින් බඳවා ගනු ලබන අයදුම්කරුවන්ගේ සම්පූර්ණ එකතුව **පනස් දෙකකි. (52).** පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## **03.** වැටුප් පරිමාණය

අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව **MT-1-2025** වැටුප් කේතය අනුව **තාක්ෂණික සහකාර (කෘෂි ව්‍යාප්ති)** III වන ශ්‍රේණියේ තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.50,090 - 10 X 540 - 11 X 630 - 10 X 1,010 - 10 X 1,190 - රු.84,420/= ක් වේ.** (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

## **04.** සාමාන්‍ය සුදුසුකම්

04.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

04.2. අයදුම්කරු උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා ශාරීරික, මානසික යෝග්‍යතාවයකින් යුතු විය යුතු අතර ම, මනා චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

04.3. අයදුම්කරු මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් උතුරු පළාතේ ස්ථිරව පදිංචි වී සිටිය යුතු වේ.

**(* සම්මුඛ පරීක්ෂණයේ දී** තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය**)**

**එසේ නැතහොත්**

අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, උතුරු පළාතේ නොකඩවා වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි අය විය යුතුය.

**(* සම්මුඛ පරීක්ෂණයේ දී** තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය**)**

04.4. අයදුම්පත් භාරගන්නා **අවසන් දිනට හෝ ඊට පෙර සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

04.5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස **අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35 ට නොවැඩි** විය යුතුය.

## 05. සුදුසුකම්

### 05.1 අධ්‍යාපන සුදුසුකම්

අ. පො.ස. (සා / පෙළ) විභාගයෙන් භාෂාව **හෝ සාහිත්‍ය** (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), **ගණිතය සහ වෙනත් කුමන හෝ විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී** සමත්ව තිබිය යුතුය. මෙහිදී **එක් වරකදී විෂයයන් පහකින් (05)** සමත්ව තිබිය යුතුය.

### 05.2 වෘත්තීය සුදුසුකම්

රජයේ විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

අංක 01/2012 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ ඒ ආශ්‍රිත අනෙකුත් චක්‍රලේඛ ප්‍රකාරව, මෙම තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලතා මට්ටම - 05 (NVQ-5) හි පාඨමාලා සහතිකය ලබා තිබීම.

**හෝ**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් සුදුසුකම්වලට සෑම අතින්ම සමාන යැයි පිළිගනු ලබන සුදුසුකමක් ලබා තිබීම.

## 06. බඳවා ගැනීමේ පරිපාටිය

06.1. ලිඛිත පරීක්ෂණය මගින් කුසලතාවය පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටිය, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදිය අනුව බඳවාගැනීම් සිදුකරනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ.

06.2. ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතරින් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලැබූ වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව පවතින තනතුරු සංඛ්‍යාවෙන් 125% ක ප්‍රතිශතයක් පත්වීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06.3. කෙසේ වෙතත්, ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල **(Merit Order)** අනුව සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව තෝරාගනු ලැබේ.

06.4. අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සියලුම සුදුසුකම්, ඒවා තහවුරු කෙරෙන ලියකියවිලි පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

## 07. විභාග ගාස්තුව

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස **රු.500/=** මුදලක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ලැබෙන පරිදි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ගෙවා, අදාළ ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කිරීමේ පිළිවෙල

08.1 මෙම නිවේදනය සමග අමුණා ඇති අයදුම්පත [www.np.gov.lk](http://www.np.gov.lk) උතුරු පළාත් නිල වෙබ් අඩවියට පිවිස බාගත කරගෙන සම්පූර්ණ කළ අයදුම්පත, **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

08.2 අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" NP/07/10/01/230"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3 ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

08.4 අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

08.5 ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපෑල - [exampscnp@gmail.com](mailto:exampscnp@gmail.com))

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ සහතික කළ පිටපතක්

## 09. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

09.1 අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමන හෝ එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **"උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ "** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට

අයදුම්කරුවන් යටත් විය යුතුය. එම රෙගුලාසි උල්ලංඝණය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් විය යුතුය.

09.2 තවද, අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි පරිදි මුහුණ සහ ඉලෙක්ට්‍රෝනික උපාංග පැළඳ නොසිටින බව තහවුරු කරගැනීම සඳහා කන් දෙකම ආවරණය නොකර විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද, එසේ තහවුරු කරගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළත්වූ මොහොතේ සිට විභාගය අවසන් වී විභාග ශාලාවෙන් පිටත්ව යන තුරු අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු වන ආකාරයෙන් මුහුණ සහ කන් දෙක ආවරණය නොකර සිටිය යුතුය.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 11. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. අයදුම්කරුවන් තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.854,880.00 ට නොඅඩු මාසික වැටුපක් ලබන ළඟම ඥාතියෙකු නොවන ස්ථිර රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු, ආගමික ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලබා සහතික කරවා ගත යුතුය.

## 12. විභාග පරිපාටිය

මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් **ප්‍රශ්න පත්‍ර 02 න්** සමන්විත වන අතර, මෙම විභාගය සිංහල සහ දෙමළ යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම ලිඛිත පරීක්ෂණයට පෙනී සිටින කිසිදු අයදුම්කරුවෙකුට ප්‍රතිඵල නැවත පරීක්ෂා කිරීම වෙනුවෙන් අයදුම් කිරීමේ හැකියාවක් නොමැත.

| අංකය | ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත්වීම සඳහා ලබාගත යුතු ලකුණු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතාව | පැය 01 යි | 100 | 40 |
| 02 | සාමාන්‍ය දැනුම (තනතුරට අදාළ තාක්ෂණය සහ විෂයය දැනුම) | පැය 01 යි | 100 | 40 |

**(විෂයය අන්තර්ගතය :- ඇමුණුම - I හි දක්වා ඇත)**

<u>සටහන</u>

මෙම විභාගය තරඟ විභාගයක් වන හෙයින් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබීමට නම් එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක්වත් **40%** ලබාගත යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් අයදුම්කරුවන් ලබාගත් වැඩිම මුළු ලකුණුවල එකතුවේ අනුපිළිවෙල (Merit Order) සළකා බලනු ලැබේ.

## 13. විභාග ප්‍රතිඵල

අයදුම්කරුවන්ගේ සම්පූර්ණ විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙහි පළකරනු ලබන අතර, තම තමන්ගේ පුද්ගලික විභාග ප්‍රතිඵල ද www.np.gov.lk ⟶ **Exams & Recruitments** ⟶ **Results** යන සබැඳිය මගින් බලාගැනීමටත්, භාගත කිරීමටත් හැකිය.

**සැළකිය යුතුය:-**

(i). මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

(ii). මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුය.

(iii). මෙම නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

(iv). මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

(v). මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ආල්වාප්පිල්ලෛ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2026.05.22**

| අනු අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය අන්තර්ගතය | කාලය | මුළු ලකුණු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. | අභියෝගතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ තාර්කික චින්තනය, විශ්ලේෂණාත්මක චින්තනය සහ තීරණ ගැනීමේ හැකියාව පරීක්ෂා කරන කෙටි හා නිර්මාණාත්මක ප්‍රශ්න අඩංගු වන පරිදි නිර්මාණය කර ඇත. | පැය 01 | 100 |
| 02. | සාමාන්‍ය දැනුම (තනතුරට අදාළ තාක්ෂණය සහ විෂයය දැනුම) | **1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකාර්මික අංශයේ දායකත්වය (Contribution of Agriculture Sector for the Economical development of Sri Lanka)**<br>1.1 දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය.<br>1.2 රැකියා අවස්ථා නිර්මාණය කිරීම.<br>1.3 කෘෂිකාර්මික අංශයට අදාළ ආනයන හා අපනයන තත්ත්වය.<br>**2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම (Knowledge regarding Climate Zones of Sri Lanka)**<br>**3. පාංශු සහ ශාක පෝෂණය (Soil and Plant Nutrition)**<br>3.1 වගා කිරීමේදී පසෙහි ස්වභාවය, ව්‍යුහය, තෙතමනය, ලවණතාවය, භෞතික හා රසායනික තත්ත්වයන්ගේ කාර්යක්ෂමතාව<br>3.2 පසෙන් ශාකවලට ලබා ගත හැකි පෝෂ්‍ය පදාර්ථ සහ ශාක පෝෂ්‍ය පදාර්ථ කළමනාකරණය.<br>3.3. ශාක පෝෂණයට අදාළ විශේෂ කරුණු<br>**4. සහල් නිෂ්පාදනය (Paddy Production)**<br>4.1. පාංශු සහ දේශගුණික අවශ්‍යතාව<br>4.2. ප්‍රභේද<br>4.3. බිම් සකස් කිරීම සහ තවාන් කළමනාකරණය<br>4.4. පළිබෝධ සහ රෝග පාලනය<br>4.5. පොහොර භාවිතය<br>4.6. ජල කළමනාකරණය/අස්වනු වැඩිකර ගැනීමේ නූතන ක්‍රමවේදය<br>4.7. අස්වනු නෙලීම හා පසු අස්වනු තාක්ෂණය<br>**5. වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය (Other field crop production)**<br>5.1. ලොකු ළූණු, මිරිස්, අර්තාපල්, බඩඉරිඟු සහ වෙනත් බෝගවල ප්‍රභේද<br>**6. එළවළු නිෂ්පාදනය (Vegetable production)**<br>6.1. එළවළු තවාන් කළමනාකරණය<br>6.2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති එළවළු ප්‍රභේද හඳුන්වාදීම, අස්වනු නෙලීම සහ සැකසීම. | පැය 01 | 100 |

**7. පළතුරු (Fruits)**

7.1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යටතේ පලතුරු වර්ග හඳුන්වාදීම සහ රෝපණ කටයුතු

**8. බෝග ආරක්ෂණය (Crop Protection)**

8.1. බෝග වගාවට වැළඳෙන රෝග හා පළිබෝධ හඳුනා ගැනීම සහ ඒවායේ පාලන විධි.
8.2. වල් මර්දනය සහ වල් මර්දන ක්‍රම
8.3. පළිබෝධනාශක භාවිතා කිරීමේදී පිළිපැදිය යුතු ආරක්ෂිත ක්‍රම

**9. ජල වහනය සහ එහි වැදගත්කම**
**(Water Percolation and its importance)**

**10. පාංශු රසායන (Soil Chemistry)**

10.1 පාංශු සංරක්ෂණයේ වැදගත්කම සහ විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම

**11. වාරිමාර්ග හා ජල කළමනාකරණය**
**(Irrigation and water management)**

11.1 විවිධ බෝග වර්ග සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රම සහ ඒවායේ ජල කළමනාකරණය
11.2 ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම

**12. ගොවිපල යාන්ත්‍රීකරණය**
**(Farm Mechanization)**

12.1. ගොවිපල් යාන්ත්‍රීකරණයේ වාසි සහ අවාසි.
12.2. බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ.
12.3. ජල සම්පාදනය හා ශාක ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ.
12.4. ඉහත යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම සහ නඩත්තු කිරීම.

**13. මීමැසි පාලනය (Bee Keeping)**

13.1. ආර්ථික වැදගත්කම
13.2. මී මැසි ගෘහ ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම.
13.3. අලෙවිකරණය සඳහා අස්වනු නෙලීම සහ සැකසීම.

**14. මල් වගාව සහ විසිතුරු ගෙවතු වගාව**
**(Floriculture and Landscaping)**

14.1. ආර්ථික වැදගත්කම
14.2. භූමි අලංකරණ ක්‍රම
14.3. විකිණීම සඳහා කැපූ මල් නිෂ්පාදනය සහ වෙළඳපොළට අනුව ඒවා සැකසීම.

**15. ආරක්ෂිත බෝග වගාව**
**(Protective Crop Cultivation)**

15.1. එහි වැදගත්කම
15.2. සැලසුම් කිරීම
15.3. බෝග තෝරා ගැනීම
15.4. අස්වනු සංරක්ෂණය සහ සැකසීම

| | | | | |
|---|---|---|---|---|
| | | **16. සත්ත්ව පාලනය (Animal Husbandry)**<br>16.1. කුකුළු පාලනය සහ කිරි නිෂ්පාදනය<br>16.2. සමෝදාන ගොවිපල් පාලනය යටතේ සත්ත්ව නිෂ්පාදන පවත්වා ගැනීම<br>**17. කෘෂිකාර්මික ව්‍යාප්තිය (Agriculture Extension)**<br>17.1. කෘෂිකාර්මික ව්‍යාප්තියේ ක්‍රමවේද සහ උපාය මාර්ග<br>17.2. කෘෂිකාර්මික ව්‍යාප්තියේ සන්නිවේදන ක්‍රම.<br>**18. පටක රෝපණය (Tissue Culture)**<br>18.1 පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම<br>18.2 පටක රෝපණයේ භාවිතයන් / යෙදීම්, උදාහරණ<br>18.3 පටක රෝපණයේ වාසි අවාසි<br>**19. පැළෑටි නිරෝධායනය පිළිබඳ දැනුම (Knowledge regarding plant protection law)**<br>19.1 පැළෑටි නිරෝධායන රෙගුලාසි පිළිබඳ දැනුම<br>19.2 පැළෑටි නිරෝධායන ක්‍රම<br>**20. ශාක සංරක්ෂණය (Plant Conservation)**<br>20.1 ශාක සංරක්ෂණයේ වැදගත්කම (ශාක/ජාන ප්ලාස්ම)<br>20.2 ශාක සංරක්ෂණ ක්‍රම (ශාක/ජාන ප්ලාස්ම)<br>**21. ජෛව තාක්ෂණය (Bio-Technology)**<br>21.2 DNA වල වැදගත්කම<br>21.2 ජානය යනු කවරක් ද, එහි ක්‍රියාකාරිත්වය<br>21.3 ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ශාක වැඩිදියුණු කිරීමට ඇති හැකියාව<br>**22. කෘෂිකර්ම සංවර්ධනය (Agriculture Development)**<br>වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති, ඒවායේ ඇති වැදගත්කම, කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය හා සම්බන්ධ රේඛීය අමාත්‍යාංශය සහ පළාත් අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, කෘෂිකර්ම සංවර්ධනය හා සම්බන්ධ මධ්‍යම රජයේ සහ පළාත් සභාවට අයත් ආයතන, ඒවායේ කාර්යභාරය, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටළු හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනය රටේ සංවර්ධනයට ආධාරවන ආකාරය, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල යහපත් හා අයහපත් බලපෑම්. | | |